# සී.ඩබ්.ඩබ්. කන්නංගර අධ්‍යාපන දර්ශනය

**එල්.ඒ.එම්. හංසනී ප්‍රමිලා උදයකුමාරි**

## හැඳින්වීම

ලංකාවේ නිදහස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට මුල් වූ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබලිව්. කන්නංගර මැතිඳුන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් කර ඇති මෙහෙය අතිශය ප්‍රශංසනීය වේ. දොන් ඩැනියෙල් විජේකෝන් කන්නංගර සහ එමලි වීරසිංහ දාව 1884 ඔක්තෝබර් 13 වැනි දින අම්බලන්ගොඩ ප්‍රදේශයේ රන්දොඹේහිදී උපත ලබන ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නංගර දරුවන් පස් දෙනෙක්ගෙන් යුත් පවුලේ තුන්වැන්නා ය (උඩගම, 2001). කුඩා කල සිට පොතපත කියවීමෙහිලා මහත් රුචියක් දැක්වූ මෙතුමා, පාසල් සමයේ සියලුම විෂයයන් ඉගෙනීමට මෙන්ම ක්‍රීඩා හා කථිකත්වයටද සහජ දක්‍ෂතා පෙන්නුම් කිරීමත්, අම්බලන්ගොඩ වෙස්ලියන් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඔහු එහිදී පෑ දස්කම් හේතුවෙන් 1897 වසරේදී ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලය මගින් පිරිනැමූ ශිෂ්‍යත්වයකට හිමිකම් කීම ඔහුගේ දක්ෂතාව සහ හැකියාවන් පෙන්නුම් කරයි (ජයසූරිය, 1988). තවද එතුමන්ට රිච්මන්ඩ් විද්‍යාලයේ සියලු පහසුකම් සහිතව ගාස්තු ගෙවීමකින් තොරව අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව උදා වීමම අතිශය වැදගත් හැරවුම් ලක්ෂයක් වන්නට ඇත. රිච්මන්ඩ් විද්‍යාලයේ ඉගෙන ගන්නා සමයේ කේම්බ්‍රිජ් දේශීය කනිෂ්ඨ පරීක්‍ෂණයෙන් ගණිතය විෂයට විශිෂ්ට සාමාර්ථයක් ඇතුළුව දෙවනි පන්තියේ සාමාර්ථයක් ලබා ගැනීමට තරම් ඔහු දක්ෂවන අතර 1902 දී කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ පරීක්‍ෂණයට මුහුණ දී විශිෂ්ට සාමාර්ථයන් සහිතව සමත්වන්නට ඔහුට හැකියාව ලැබේ (ජයවීර, 1989). තවද, එම සමයේ රිච්මන්ඩ් විද්‍යාලය මගින් පිරිනමන පාක් ශිෂ්‍යත්වය, ගුණවර්ධන ශිෂ්‍යත්වය හා ජුබිලි ශිෂ්‍යත්වයද දිනා ගැනීමට හැකිවීමද සඳහන් කළ යුතුව ඇත. 1904 වසරේදී රිච්මන්ඩ් විද්‍යාලයේ ගණිත ගුරුවරයෙකු ලෙස සේවයට එක් වෙන තරුණ ක්‍රිස්ටෝපර් රිච්මන්ඩ් විද්‍යාලයෙන් පසුව වේල්ස්කුමර විද්‍යාලය, මෙතෝදිස්ත විද්‍යාලය

හා වෙස්ලි විද්‍යාලයේ ගණිත ගුරුවරයකු වශයෙන් සේවය කරන අතර නීති විද්‍යාලයට බැඳී නීතිය ද හදාරණු ලැබීය (දොරේසාමි, 1998). 1923 වසරේදී පැවැත්වූ මැතිවරණයේදී ඔහු ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ දකුණු පළාත නියෝජනය කිරීම සඳහා බහුතර ඡන්දයකින් තෝරා පත්වෙන අතර 1931දී ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව විසුරුවන තෙක්ම එහි කටයුතු කිරීමට එතුමන්ට හැකියාව ලැබේ (ජයතිලක, 1994). 1931 වසරේදී රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්වෙන කන්නංගරයන් 1936 වසරේදී දෙවන වරටත් රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කරයි. 1931 දී සී.ඩබ්.ඩබ්. කන්නංගර අධ්‍යාපන කාරක සභාවෙහි සභාපතිවරයා වශයෙන් පත්වෙන අතර රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් කටයුතු කිරීම ආරම්භ කරයි. 1938 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට නව අධ්‍යාපන ආඥා පනතක් සඳහා වූ යෝජනාව ඉදිරිපත් කළේය (ජයවීර, 1989). මෙම සමය උසස් පාසල්වලට වරප්‍රසාද ලත් පිරිස පමණක් ඇතුල් වූ සමයයි. එහෙයින් අධ්‍යාපන පද්ධතියේ පැවති දුර්වලතා අවම කරගනිමින්, අධ්‍යාපනය සෑම සිසුවෙකුටම ලබාගත හැකි දෙයක් සහ ළඟා කරගත හැකි මට්ටමට ළඟා කරගැනීමට එතුමන් කටයුතු කළේය. සියලු දෙනාටම සම අධ්‍යාපන අයිතිය ලබා දීමට ගෙන ආ යෝජනාව දුෂ්කරතා මධ්‍යයේ සම්මත කරගැනීම එදා මෙදා තුර අධ්‍යාපන අමාත්‍යවරයෙක් සිදුකළ ඉහළම කැපකිරීම ලෙස හැඳින්වීමට විද්වතුන් පසුබට නොවන්නේ එහෙයිනි. ඒ හා සමගාමීව ගම්බද අධ්‍යාපනය නගා සිටුවීමට මධ්‍ය විද්‍යාල ආරම්භ කිරීමද ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් බඳුය (ජයසූරිය, 1988). 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අධ්‍යාපනය පිළිබඳ විධායක කාරක සභාවේ සභාපති පදවියට පත් එතුමන් සිය නිදහස් අධ්‍යාපන සිහිනය සැබෑ කර ගැනීම සඳහා වසර පහළොවකට ආසන්න කාලයක් විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් නොසැලී කටයුතු කළේය. කන්නංගර ප්‍රතිසංස්කරණ පිළිබඳව අවධානය යොමු කිරීමේදී කන්නංගර සමයේ ප්‍රථම භාගය සහ අවසන් භාගය ලෙස (සුළු සංශෝධන යුගය සහ මහා සංශෝධන යුගය) අංශ දෙකකින් මෙම ප්‍රතිසංස්කරණ පිළිබඳව අවධානය යොමු කළ හැකිය (උඩගම, 2001). පොදුවේ ගත් කල 1938 දී හා 1944 දී කන්නංගර ඇමතිවරයා විසින් පත්කළ අධ්‍යාපන කාරක සභා හරහා සම්මත වී ක්‍රියාත්මක වූ වැදගත් යෝජනා කිහිපයක්

පහත පරිදි පෙළ ගැස්විය හැකිය (උඩගම, 2001).

- මධ්‍ය විද්‍යාල ආරම්භ කිරීම
- අධ්‍යාපන අවස්ථා සුලභ කිරීම
- පළමුවන වසර සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා නිදහස් අධ්‍යාපනය ලබාදීම
- අඩු ආදායම්ලාභී පවුල්වල දක්ෂ ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ක්‍රමයක් පිහිටුවීම මගින් ගම්බද අධ්‍යාපනය පුළුල් කිරීම. (5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය ආරම්භ කිරීම)
- පාසල් පද්ධතිය රජයට පවරා ගැනීම
- ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගුරු විද්‍යාල පිහිටුවීම
- මවු භාෂාවෙන් ඉගැන්වීම සිදු කිරීම හා දෙවන පන්තියේ සිට ඉංග්‍රීසි ඉගෙනීම අනිවාර්ය කිරීම
- පාසල් සඳහා පොදු විෂය නිර්දේශ සකස් කිරීමට කටයුතු කිරීම
- හන්දෙස්ස ක්‍රමය හඳුන්වා දීම
- අධ්‍යාපනික උපයෝගී සේවාවන් ආරම්භ කිරීම. (සෞඛ්‍ය, දිවා අහාර, ගමන් පහසුකම් හා පාසල් ගුවන්විදුලි සේවාව ආරම්භ කිරීම)
- ස්ථිර ගුරු වැටුප් හා විශ්‍රාම ගුරු වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම
- ලංකා වෛද්‍ය විද්‍යාලය හා යුනිවර්සිටි කොලීජිය ඒකාබද්ධ කර ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීම

මෙම ප්‍රතිසංස්කරණ කිහිපයක් පිළිබඳව කෙටියෙන් නමුත් විස්තර කිරීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය පිළිබඳව අධ්‍යයනය කිරීමට සහ අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී වැදගත් වේ.

**මධ්‍ය විද්‍යාල ආරම්භ කිරීම සහ පහ වසර ශිෂ්‍යත්ව ක්‍රමය හඳුන්වා දීම**

කන්නංගර ප්‍රතිසංස්කරණය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ ලංකාවේ මධ්‍ය විද්‍යාල ආරම්භයයි (ගුණවර්ධන, 1990). මෙය කන්නංගර සමයට අමරණීය බවක් ගෙන දෙන්නක් බව මහාචාර්ය රන්ජිත් රුබේරු (1994) පෙන්වා දෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සෑම ඡන්ද කොට්ඨාසයකටම එක් මධ්‍ය විද්‍යාලයක් ලබා දීම ආරම්භ කරනු ලැබීය. ඒ අනුව ලංකාව පුරාම මධ්‍ය විද්‍යාල 54 ආරම්භ විය (දොරේසාමි, 1998). මේ හේතුවෙන් එවකට නගරයට හා සුළු පිරිසකට පමණක් සීමාවූ අධ්‍යාපනය හා විශ්වවිද්‍යාල ප්‍රවේශය ඈත දුෂ්කර ගම්මානවල ජීවත් වූ දක්ෂ දරු දැරියන්ට ලබා ගැනීමට හැකි වූවා මෙන්ම ප්‍රධාන නගර වටා එක්වූ අධ්‍යාපන තත්ත්වය ඉහළ මට්ටමක පැවති නගරවලට පැමිණි සිසු දරුවන්ට තමන්ට ආසන්නම වූ නගරයකින් ඉහත ප්‍රධාන පාසලක් ලෙස සැලකූ අධ්‍යාපන මට්ටම තමාට ආසන්නම නගරයේ මධ්‍ය විද්‍යාලයෙන් ලබාගැනීමේ හැකියාව ග්‍රාමීය දරුවන්ට උදාවිය (ජයසූරිය, 1988). මධ්‍ය විද්‍යාලවල ප්‍රධානම ලක්ෂණය වුයේ අධ්‍යාපනයට ප්‍රාදේශීය හැඩයක් ලබා දීමයි. විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම් නොලබන පිරිසට තාක්ෂණික ශිල්පීය හැකියා ගොඩනගා ගැනීමට අවස්ථාවද කන්නංගර ප්‍රතිසංස්කරණ තුළ දක්නට විය. කලා, වාණිජ, විද්‍යා, කෘෂිකර්මය වැනි මූලික විෂය ක්ෂේත්‍රයන්ට අමතරව ලී වැඩ, වතු වැඩ, මේසන් වැඩ, මැටි වැඩ, ගොවිපළ, ගෙවතු වගාව යන අංශය පාසල තුළට යොමු කිරීම කන්නංගර ප්‍රතිසංස්කරණ තුළ විය. මේ හේතුවෙන් පාසල තුළ විශේෂ අංශ සඳහා දක්ෂතා ඇති දරුවන්ට සෘජු අධ්‍යාපනයෙන් ඉවත්වී තම දක්ෂතා අනුව අධ්‍යාපනය ලබා ගැනීමට හැකියාව මෙමගින් ලැබුණි. තවද සයවන ශ්‍රේණියෙන් ඉහළ ශ්‍රේණි ඇතුළු පශ්චාත් ප්‍රාථමික පන්ති පමණක් මෙහි ක්‍රියාත්මක වූ අතර උපාධිධාරීන් සහ පුහුණු ගුරුවරුන්ගේ සහය ඇතුව විවිධ අංශවලින් ඉතාම උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබාදීමට කටයුතු කරන ලදී (ජයතිලක, 1994). එසේම ජාතීන් අනුව සම අවස්ථා නොලැබී සිටි ජනතාවටද කන්නංගර ප්‍රතිසංස්කරණ හේතුවෙන් සහනයක් ලැබුණි. යම් ගුරුවරයකුගේ ඉගැන්වීමේ මාධ්‍ය සිංහල නම් එකී ගුරුවරයා අනිවාර්යය භාෂාව ලෙස දෙමළ භාෂාව හැදෑරිය යුතු විය (ප්‍රේමරත්න, 1991). කන්නංගර ප්‍රතිසංස්කරණ තුළ මෙම ද්වි භාෂා සංකල්පය

ප්‍රධාන තැනක් ගනු ලැබීය. මේ හේතුවෙන් පසුකලෙක ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට මෙන්ම ප්‍රධාන විශ්වවිද්‍යාලයනට සිසුන් ඇතුළත් වීමේදී කන්නංගර මධ්‍ය විද්‍යාලවල අධ්‍යාපනය ලැබූ සිසුන්ගේ දක්ෂතා කැපීපෙනුණු ලක්ෂණයක් විය (ගුරුගේ, 1992). පහ වසර ශිෂ්‍යත්ව ක්‍රමය කන්නංගර මැතිතුමා විසින් හඳුන්වාදුන් අතර එහිදී මධ්‍ය විද්‍යාලවලට දක්ෂතා සහිත සිසුන්ට ඇතුළත් වීමේ හැකියාව, ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව ලබාදීමක් සිදු කළේය (ජයවීර, 1989). තවද මධ්‍ය විද්‍යාල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූ උසස් අධ්‍යාපන අවස්ථා ග්‍රාමීය ප්‍රදේශවලට ගෙනයාමත්, පාසල් විෂයමාලාව ප්‍රතිසංවිධානය කිරීමට ගත් උත්සාහයත් සාර්ථක වූ බවත්, අධ්‍යාපනයේ විෂම ව්‍යාප්තිය අවම මට්ටමකට ගෙන ඒමට එමගින් හැකියාව ලැබුණු බවත් කිව හැකිය.

**ග්‍රාමීය පාසල් ක්‍රමය ආරම්භ කිරීම**

ග්‍රාමීය පාසල් ක්‍රමය ආරම්භ කිරීම ද කන්නංගර සමයේ මුල් යුගයේ ඇති වූ අතිශය වැදගත් යෝජනාවක් ලෙස සැලකිය හැකිය. මෙයින් බලාපොරොත්තු වුයේ පාසල් විෂයමාලාවට විවිධත්වයක් ගෙන එමින්, අධ්‍යාපනය සහ ආර්ථිකය අතර සම්බන්ධයක් ඇති කරමින් කුසලතා සහිත සිසුන් පිරිසක් බිහි කිරීම බව පෙනේ (ගුණවර්ධන, 1990). මේ හේතුවෙන් තාක්ෂණික හා ස්වකීය දක්ෂතා සහිත පිරිස් හට ජීවත් වීමට අවශ්‍ය ශිල්පීය කුසලතාවයන් වටහා ගැනීමට හැකියාව ලැබුණි. මෙකී ප්‍රතිසංස්කරණ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ලාංකීය ශිෂ්‍යයා නිවැරදි ලෙස හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතා මත සමව බෙදී ගිය අධ්‍යාපන දර්ශනයක් ගොඩ නැංවීමට මෙතුමා කටයුතු කළ බවයි. විධිමත් පාසල් අධ්‍යාපනයෙන් ගිලිහෙන දරුවන්ට ඔවුන්ගේ ප්‍රායෝගික දක්ෂතා ඉස්මතු කරගනිමින්, ස්වකීය ග්‍රාමය ස්වයංපෝෂිත කිරීමට හැකියාවක් ලබාදීම මෙහි අරමුණ විය. මහනුවරට නුදුරු හන්දෙස්ස නම් ග්‍රාමයේ රජයේ පාසලක් කේන්ද්‍ර කරගෙන ආරම්භ කරන ලද හෙයින් මෙම ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය "හන්දෙස්ස ක්‍රමය'' නමින් ප්‍රචලිත ය. මෙමගින්, පාසලේ විෂයමාලාව එම ප්‍රදේශයේ හෝ ග්‍රාමයේ පවතින රැකියාවන්ට සම්බන්ධ කිරීම සිදු කරන ලදී (ප්‍රේමරත්න, 1991). මෙහි විෂයමාලාව යටතට සෞඛ්‍ය, පරිසර අධ්‍යයනය, සාහිත්‍යය සහ විවිධ වෘත්තීන් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම ඇතුළත් විය. උදාහරණයක් ලෙස වැසිකිලි කැසිකිලි

පද්ධති ඉදි කිරීම, පාසල් වත්තේ ගොවිතැන් කිරීම, පාසල් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, ශාරීරික අභ්‍යාස පුහුණුව සහ ප්‍රථමාධාර පුහුණුව ලබා දීම, මේස පුටු අලුත්වැඩියා කිරීම, වේවැල් භාණ්ඩ නිෂ්පාදනය, ඉදල් කොසු නිෂ්පාදනය ආදී නේකවිධ අංශ මෙහිදී අවධානයට ගත හැකිය. ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය අතිශය සාර්ථක ක්‍රමයක් ලෙස එකල ප්‍රචලිත වූ අතර එහි දියුණුව කොතෙක්දයත්, ඒ සඳහාම විෂය ප්‍රවීණ ගුරුවරුන් පුහුණු කිරීමේ අවශ්‍යතාවද ඉස්මතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය ගුරු පුහුණු මධ්‍යස්ථානයක් මීරිගම ප්‍රදේශයේ ආරම්භ කිරීමට කටයුතු කරන ලදී (ගුරුගේ, 1992). ඉන් නොනැවතී, මෙම පුහුණු ගුරුවරුන් හරහා විධිමත් ශිල්පීය පුහුණුවක් දරුවන්ට ලබාදෙන ලදී. මෙමගින් පෙනී යන්නේ ග්‍රාමීය ආර්ථිකය සහ පාසල එකිනෙකට සම්බන්ධ වීමෙන් ස්වයංපෝෂිත ආර්ථිකයක් ඇති කිරීමෙහිලා හන්දෙස්ස ක්‍රමයේ ආරම්භය මූලික අඩිතාලමක් දැමූ බවයි.

## ගුරු පුහුණුව සහ ගුරුවරුන් සම්බන්ධයෙන් ගත් ධනාත්මක ප්‍රතිපත්ති

කන්නංගර ප්‍රතිසංස්කරණයේ දී හඳුන්වා දුන් අධ්‍යාපන ඩිප්ලෝමා විභාගය පිළිබඳව සලකා බැලීම, ගුරු පුහුණුව සම්බන්ධයෙන් ගෙන තිබෙන ධනාත්මක ප්‍රතිපත්ති සඳහා කදිම නිදසුනක් වේ. මෙය 1931 දී ආරම්භ කළ අතර මෙම විභාගයට අධ්‍යපන ඉතිහාසය ද ඇතුළත් විය. එසේම 1937 දී මෙම විභාගයට ප්‍රායෝගික කොසටක් එක් වූ අතර ඉගැන්වීමේ කුසලතා මැන බැලීම සඳහා මෙම ක්‍රමය යොදාගන්නා ලදී. වර්තමානයේ විශ්වවිද්‍යාලවල අධ්‍යයනය සිදුකරන අධ්‍යාපන පාඨමාලවල මෙම ප්‍රයෝගික ඉගැන්වීමේ කුසලතාවය මැන බැලීම ආරම්භ වී ඇත්තේ ඉහත කන්නංගර ප්‍රතිපත්තිවලට අනුව බව මේ අනුව පිළිගත හැකිය (ජයසූරිය, 1988). මෙහිදී පුද්ගලයකුගේ දක්ෂතාවය මත විභාගද, දේශපාලන පක්ෂ, පන්තිවලින් තොර ස්වකීය ඉගැන්වීමේ කෞශල්‍යය මත ගුරුවරුන් අධ්‍යපන ක්ෂේත්‍රයට යොමුකිරීම තුළින් අධ්‍යාපන සම අවස්ථා අවශ්‍ය ස්ථානයෙන් ආරම්භකර සිදුකිරීම මෙහිදී පැහැදිලිව ප්‍රකට වේ. කන්නංගර මැතිතුමා තම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අවසන් පියවර ලෙස සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කළේ නිපුණතාවයෙන් සන්නද්ධ ගුරු පරපුරකි. ඒ අනුව උපාධිධාරී ගුරුවරුන් විශ්වවිද්‍යාලවලදී හා සාමාන්‍ය ගුරුවරුන් ගුරු විද්‍යාලවලදී පුහුණු කර සේවයේ යෙදවීමට එතුමා යෝජනා

කළේය (ගුණවර්ධන, 1990). ගුරුවරුන්ගේ ආචාර ධර්ම පිළිබඳවද කන්නංගර මහතා අවධානය යොමු කළේය. තවද එතෙක් ක්‍රියාත්මක වූ වාර්ෂික ආධාර ලබා දීමේ ක්‍රමය වෙනුවට, මාස්පතා වැටුප් ගෙවීමේ ක්‍රමයක් ආරම්භ කරන ලදී. මෙය, අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත් අතිශය ධනාත්මක තීරණයක් විය.

### අධ්‍යාපනය උපයෝගී සේවාවක් බවට පත් කිරීම

අධ්‍යාපනය සමාජීය සේවයක් බවට පත් කිරීම කන්නංගර ප්‍රතිසංස්කරණ අතර ඇති වැදගත් යෝජනාවක් වේ. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම, දරුවන්ට දිවා ආහාරය ලබාදීම, පාසල් ගුවන් විදුලි සේවයක් ආරම්භ කිරීම ආදිය මෙහිලා අතිශය වැදගත් තීරණ වේ (ප්‍රේමරත්න, 1991). පාසල් තුළ දිවා ආහාර ලබාදීම යම් ආකාරයකට අධ්‍යාපනයේ සම අවස්ථා ලබාදීමක් ලෙස සැළකිය හැකිය. පන්ති පරතරය මත සමාජයේ සිටින දරුවා හට පෝෂ්‍ය පදාර්ථ සහිත ආහාරයන් ලබා දීමෙන් සිසුවාගේ කායික පූර්ණත්වයෙන් පසු අධ්‍යාපනයේ නියැළීමේ අවකාශය පූර්ණය කිරීමද මෙකී ප්‍රතිසංස්කරණ තුළින් සිදුවූ අතර එකල ඇති වූ විවිධ වසංගත රෝග තත්ත්ව හේතුවෙන් පිරිහී තිබූ සෞඛ්‍ය මට්ටම, අධ්‍යාපනයට ඍජුවම සම්බන්ධ විය. මෙම තත්ත්වය අවම කිරීම සඳහා පාසල්වලට දිවා ආහාරය ලබා දීම මෙන්ම පාසල් තුළ දන්ත වෛද්‍ය සේවාවන් ආරම්භ කිරීම ද සිදු කරන ලදී. තවද ඉගැන්වීමට සහය වන ආධාරකයක් ලෙස ගුවන් විදුලිය භාවිත කිරීම ආරම්භ වන්නේ ද මේ කාලයේදී ය. එම වැඩසටහන් සංවිධානාත්මක කාලසටහනක් අනුව ක්‍රියාත්මක වූ අතර පාසල තුළ ඉගැන්වූ විෂයන් මෙන්ම සාමන්‍යය දැනුම සහ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම ද සිදුවිය (ජයවීර, 1989). මෙය දියුණු රටවල පාසල් සිසුන්ගේ සන්නිවේදන කුසලතා ඉහළ නැංවීම සඳහා භාවිතා කරන වඩාත් ප්‍රචලිත ක්‍රමයක් වේ. 1988-1994 කාලයේ දිවා ආහාර කූපන් පත් ලබාදීම, කිරි, සුප් වර්ග ලබාදීම ආදිය සිදුවූයේ කන්නංගර ප්‍රතිසංස්කරණවල මූලාරම්භයේ සිදු වූ හඳුන්වාදීම තුළිනි.

### වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයේ ආරම්භය

එවක ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් අතර අවම සාක්ෂරතා හැකියාවක් පැවති බවත් එය එවකට ජනගහණයෙන් සියයට පනහක්

බවත් සඳහන් විය. මේ හේතුව නිසාම ග්‍රාමීය අධ්‍යාපනය හා සමගාමීව වැඩිහිටියන්ට ඉගැන්වීමේ ක්‍රමවේදයක්ද සකස් කරන ලදී. මෙම ක්‍රමය ආරම්භයේදී ලිවීම සහ කියවීම දුර්වල වැඩිහිටියන් සඳහා පන්ති පැවැත් වූ අතර වැඩිහිටියන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා විවිධ සාකච්ඡා සහ දේශන යනාදිය ක්‍රියාත්මක කරන ලදී (ජයතිලක, 1994). මෙහිදී සෞඛ්‍ය, කෘෂිකර්මාන්තය, සමුපකාරය, කළමනාකරණය වැනි විෂය ක්ෂේත්‍රවල දැනුම මොවුන්ට ලබා දුනි. මෙම වැඩිහිටි අධ්‍යාපනය හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය සහ අනෙකුත් අංශ සීග්‍රයෙන් දියුණු වූ බව නොකිවමනාය. වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයට සාපේක්ෂව රාත්‍රී ඉංග්‍රීසි පාඨශාලා ක්‍රමයක්ද ආරම්භ විය. එය, ඉංග්‍රීසි විෂය ඉගෙනීමට කැමැත්තක් දක්වූ තරුණයන් ආකර්ෂණය කර ගැනීමටද හේතු සාධකයක් විය (ගුණවර්ධන, 1990).

තවද, මෙම ප්‍රධාන ප්‍රතිසංස්කරණවලට අමතරව ස්වභාෂා පාසල්වල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, තෝරාගත් ලන්දේසි සම්භවයක් සහිත ළමුන්ට ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම, විභාග සඳහා යම් යම් සංශෝධන සිදු කිරීම ආදිය සිදු කරන ලදී. මහාචාර්ය රන්ජිත් රුබේරුට (1994) අනුව, එතෙක් ක්‍රියාත්මක වූ පාසල් හැර යාමේ සහතික පත්‍ර විභාගය සහ ගුරු ආධුනිකයක් සඳහා වූ ප්‍රාරම්භ විභාගය වෙනුවට ඉංග්‍රීසි මාධ්‍යයෙන් සහ ස්වභාෂා මාධ්‍යයෙන් පවත්වන, කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සහ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය ආරම්භ කරන ලදී (පීරිස්, 1993). තවද කේම්බ්‍රිජ් කනිෂ්ඨ විභාගය අහෝසි කළ අතර ප්‍රථමවරට විභාග මණ්ඩලයක් පත් කරන ලදී. මේ සංශෝධනවලට අමතරව, පාසල් වර්ෂය සකස් කිරීම සහ මූලික අධ්‍යාපන අවස්ථා වැඩි කිරීමද මෙම සමයේ ඇති වූ ප්‍රගතිශීලි කර්තව්‍යයන් වේ (ජයතිලක, 1994).

**සමාලෝචනය**

කන්නංගර මහතා නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියෙන් අපේක්ෂා කළේ නිපුණතාවෙන් යුත් සිසු පරපුරක් බිහි කිරීමයි. පොතපතට සීමා වූ ශාස්ත්‍රීය නැඹුරුතාවක් සහිත සිසු පරපුරක් පමණක් බිහිවනු දැකීම එතුමන්ගේ අපේක්ෂාව නොවීය. හන්දෙස්ස අධ්‍යාපන සැලැස්ම ඊට කදිම උදාහරණයකි. මේ අනුව කන්නංගර ප්‍රතිසංස්කරණය

පිළිබඳ සම අධ්‍යාපන අවස්ථා ලැබීම පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී අධ්‍යාපනිකව සිසුවාගේ බුද්ධිය, කෞශල්‍යය, හැකියා හා නාගරික, ග්‍රාමීය වශයෙන් නොබෙදා අධ්‍යාපනය ලබා ගැනීමට අවකාශයන් තම පන්තිය, කුලය, සමාජ පංති හැකියාවන් පිළිබඳ නොසලකා සමස්ත සිසුන්ගේ ආහාරය, නේවාසික පහසුකම් තුළ ඇති සියලු විෂමතාවන් අවසන් කළ ලංකාවට යෝග්‍ය වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ලෙස කන්නංගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දිය හැකිය (ජයසූරිය, 1988). මේ තුළින් එතුමන් උත්සාහ කළේ සම්ප්‍රදායික විෂයමාලාව ඉවත් කර ජනතාවගේ ජීවිත හා ජීවනෝපායන් සමග පාසල් කටයුතු බද්ධ කරමින් කෘෂිකර්මාන්ත හා විවිධ ශිල්ප ඉගෙනීමට දරුවන් පෙළඹවීමයි. රැකියා ලෝකය ඉල්ලක්ක කර ගනිමින් හඳුන්වා දුන් මෙම අධ්‍යාපන සැලැස්ම ශ්‍රී ලංකා අධ්‍යාපන මන්පෙතෙහි අතිශය වැදගත් සන්ධිස්ථානයක් උසුලයි (ගුණවර්ධන, 1990). තවද රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙක් හා ඇමතිවරයෙක් ලෙස සියළුම සභා වාරවලට පැමිණ තිබූ පුද්ගලයෙක් ලෙස සඳහන් කළ හැකි කන්නංගර මැතිතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉටුකළ අනුපමේය සේවයට ගරු කිරීමක් වශයෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය විසින් 1943 වසරේදී ආචාර්ය උපාධියක් පිරිනමා තිබේ (දොරේසාමි, 1998). නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හඳුන්වා දෙමින් ශ්‍රී ලාංකික දූවා දරුවන්ට නිදහස් අධ්‍යාපන ක්‍රමයත්, ආර්ථිකය සහ අධ්‍යාපනය එකිනෙකට සම්බන්ධ කරලමින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ඇති කිරීමටත් එතුමා කළ මෙහෙවර සදා අමරණීය වන්නේද, ඇගයුමට පාත්‍ර වන්නේද එහෙයිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ආනන්ද ඩබ්ලිව්. පී. ගුරුගේ (1992). *අධ්‍යාපනය මෙහෙයවීමේ බලයඃ අදාළ බව හා තත්ත්වය කෙරෙහි ඇති ආභාෂය.*

කේ. ඩබ්ලිව්. ගුණවර්ධන. (1990). *අතීතය පිළිබඳ කන්නංගර දර්ශනය - යටත් විජිත පාලන සමයේ අධ්‍යාපනය ආගම, සංස්කෘතිය හා සමාජය.*

ජී. එල්. පීරිස්. (1993). *ජාතික සංවර්ධනයට පදනමක් වූ කන්නංගර ප්‍රතිසංස්කරණ.*

ජේ. ඊ. ජයසූරිය. (1988). *අධ්‍යාපනයේ ප්‍රජාතන්ත්‍රීකරණයඃ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නංගර මැතිතුමාගෙන් ඉටු වූ සේවය.*

ප්‍රේමදාස උඩගම. (2001). *යටත් විජිතවාදය, ගෝලීයකරණය සහ අධ්‍යාපනය.*

බෝගොඩ ප්‍රේමරත්න. (1991). *අධ්‍යාපනය, නිදහස රැක ගැනීම පිණිස විය යුතු යඃ නිදහස් අධ්‍යාපනයට නව අර්ථකථනයක්.*

ලක්ෂ්මන් ජයතිලක. (1994). *ස්වාධීනත්වය උදෙසා අධ්‍යාපනය - සංවර්ධනය, පෞද්ගලික නිෂ්ඨාවන් හා සමාජ ප්‍රමුඛතාවන් සම්බන්ධ ගැටලු.*

ස්වර්ණා ජයවීර. (1989). *අධ්‍යාපන අවස්ථා ව්‍යාප්ත කිරීම නොනිමි කර්තව්‍යය.*

සිවනන්දිනී දොරේසාමි. (1998). *හින්දු සමයවාදී අධ්‍යාපනය සහ ආචාර්ය කන්නංගර අධ්‍යාපන දර්ශනය බලවත්ත කිරීමේ මෙවලමක් ද? නැතහොත් සමාජ සචලතාව ලබා ගැනීමේ උපකරණයක් ද?*